සියලු ම හිමිකම් ඇවිරිණි]
All Right Reserved]

# අධ්‍යාපන කලාපය - මතුගම
# Educational Zone - Mathugama

## දෙවන වාර පරීක්ෂණය - 2019

**13 ශ්‍රේණිය**

## ඉතිහාසය I

කාලය පැය තුනයි

**ශ්‍රී ලංකාවේ ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1978 දක්වා**

උපදෙස් :

* මෙම කොටස ප්‍රශ්න 40 කින් සමන්විත වේ. සියලු ම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
* එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහ බැගින් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ එකක් පමණි. එම නිවරදි පිළිතුර තෝරා දී ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
* මෙම කොටසට ලකුණු 40 ක් දෙනු ලැබේ.
* කොටස් දෙකට ම මුළු කාලය පැය තුනකි. පිළිතුරු ලියා අවසන් වු පසු I කොටස II කොටසේ පිළිතුරු පත් සමඟ අමුණා භාර දෙන්න.

---

○ අංක 01 සිට 05 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරින් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ නොගැළපේ. එම නොගැළපෙන නම කුමක්දැයි හඳුනාගෙන එහි අංකය වරහන තුළ ලියන්න.

01. (1) පණ්ඩු (2) බුද්ධ පාරින්ද (3) තිරිතර
(4) පනයමාර (5) දාඨිය (........)

02. (1) පදිර් පත්තු (2) ආර්පාක්කම් (3) තිරුවාලන්ගාඩු
(4) පල්ලවරායන් පොට්ටෙයි (5) විදම්බරම් (........)

03. (1) ආලාහන පිරිවෙන (2) සුනානන්ද පිරිවෙන (3) ඉරුගල්කුලතිලක පිරිවෙන
(4) විජයබා පිරිවෙන (5) පද්මාවති පිරිවෙන (........)

04. (1) ජෝර්ජ් ටර්නර් (2) ලෙනාඩ් වුල්ෆ් (3) ජෝන් ඩොයිලි
(4) ජෝර්ජ් බර්ඩ් (5) එමර්සන් ටෙනන්ට් (........)

05. (1) එච්. එස්. ඕල්කට් (2) ආරුමුග නාවලර් (3) වලිසිංහ හරිස්චන්ද්‍ර
(4) එම්. සී. සිද්දි ලෙබ්බේ (5) වොරින්ටන් සාමි (........)

○ අංක 06 සිට 10 තෙක් ප්‍රශ්න වල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරින් එක යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

06. (1) නිකාය සංග්‍රහය - දේවරක්ෂිත ජයබාහු හිමි
(2) සද්ධර්මරත්නාවලිය - ධර්මසේන හිමි
(3) සිදත් සඟරාව - වේදේහ හිමි
(4) ජානකීහරණය - බුද්ධදාස රජතුමා
(5) කව් සිළුමිණ - II පරාක්‍රම බාහු රජතුමා (........)

07. (1) රන්කොත් වෙහෙර - I පරාක්‍රම බාහු
(2) සේරුවාවිල දාගැබ - කාවන්තිස්ස
(3) අම්බස්ථල දාගැබ - උත්තිය
(4) අභයගිරි දාගැබ - වළගම්බා
(5) ජේතවනාරාම දාගැබ - මහසෙන් (........)

08. (1) ගොඩවාය සෙල්ලිපිය - වරාය බදු පිළිබඳව
(2) හෝපිටිගම සෙල්ලිපිය - වෙළඳපොළ පාලනය
(3) බෝවත්තේගල සෙල්ලිපිය - දසමහ යෝධයෝ පිළිබඳව
(4) තෝනිගල සෙල්ලිපිය - ධාන්‍ය තැන්පත් කරන ලද බැංකු ක්‍රමයක් (........)

09. (1) II රාජසිංහ රජු - ටිකිරි කුමාරයා
(2) I විමලධර්මසූරිය රජු - කොනප්පු බණ්ඩාර
(3) ධර්මපාල කුමාරයා - දෙන් ජුවන් පෙරියබණ්ඩාර
(4) VI භුවනෙකබාහු රජු - සපුමල් කුමාරයා
(5) VIII වීර පරාක්‍රමබාහු රජු - අම්බුළුගල කුමාරයා (........)

10. (1) ෆෙඩ්රික් නෝර්ත් - රාජකාරි ක්‍රමය අහෝසි කිරීම
(2) එඩ්වඩ් බාන්ස් - කොළඹ මහනුවර මාර්ගය ඉදිකිරීම
(3) හර්කියුලිස් රොබින්සන් - ගම්සභා ප්‍රතිෂ්ඨාපනය කිරීම
(4) හෙන්රි වෝඩ් - කෞතුකාගාරය පිහිටවීම
(5) ආතර් හැව්ලොක් - ධාන්‍ය බද්ද අහෝසිකිරීම (........)

○ අංක 11 සිට 15 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම/ ප්‍රකාශන/ දින / වකවානු සමූහයක් X හා Y තීරුවල දී ඇත. Y තීරුවේ දී ඇති නාම/ ප්‍රකාශන/ දින / වකවානු සමූහයක් X තීරුවේ දී ඇති ඒවා සමග කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. Y තීරුව X තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝජන පහෙන් එකක් නිවැරදිය. නිවැරදි සංයෝගයට අයත් අංකය තෝරා වරහන තුළ ලියන්න.

11.

| X | Y |
|---|---|
| (I) කොට්ටල් බද්ද | A. අලි ඇතුන් පිළිබඳ කාර්යාංශය |
| (II) කොට්කා බද්ද | B. කුරුඳු පිළිබඳ කාර්යාංශය |
| (III) මහ බද්ද | C. පුවක් පිළිබඳ කාර්යාංශය |
| (IV) මඩිගේ බද්ද | D. ශිල්පීන් පිළිබඳ කාර්යාංශය |
| (V) කුරුවේ බද්ද | E. ප්‍රවාහන කාර්යාංශය |

(1) DCABE (2) DBAEC (3) DCBEA (4) EDBEA (5) ADBEC (........)

12.

| X | Y |
|---|---|
| (I) ක්‍රි.ව. 1215 | A. පෘතුග්‍රීසීන් පලවා හැරීම |
| (II) ක්‍රි.ව. 1521 | B. දෙවන නිදහස් සටන |
| (III) ක්‍රි.ව. 1658 | C. ඉංග්‍රීසීන්ගේ පැමිණීම |
| (IV) ක්‍රි.ව. 1796 | D. කාලිංග මාඝ ආක්‍රමණය |
| (V) ක්‍රි.ව. 1848 | E. විජයබා කොල්ලය |

(1) EACBA (2) DECAB (3) DACBE (4) DEACB (5) AEBCD (........)

13.

| X | Y |
|---|---|
| (I) මුන්නේශ්වරම් කෝවිල | A. පොළොන්නරුව |
| (II) කෝනේශ්වරම් කෝවිල | B. යාපනය |
| (III) තිරුකේතීස්වරම් කෝවිල | C. හලාවත |
| (IV) වාහමන් මාදේවි කෝවිල | D. ත්‍රිකුණාමලය |
| (V) කන්දසාමි කෝවිල | E. මන්නාරම |

(1) ABDEC (2) ECDAB (3) DCEBA (4) CDEAB (5) BDECA (........)

14.

| X | Y |
|---|---|
| (I) වසභ | A. මහ කනදරා වැව |
| (II) මහසෙන් | B. යෝධ වැව |
| (III) ධාතුසේන | C. පරාක්‍රම සමුද්‍රය |
| (IV) I විජයබාහු | D. මහවිලච්චිය වැව |
| (V) I පරාක්‍රමබාහු | E. බුදුගුණවාසි |

(1) ADBEC (2) DABEC (3) EDACB (4) BDAEC (5) CADBE (........)

15.

| | X | | Y |
|---|---|---|---|
| (I) | පරමධම්මචේතිය පිරිවෙන | A. | අරුමුග නාවලර්තුමා |
| (II) | විද්‍යෝදය පිරිවෙන | B. | එච්. එස්. ඕල්කට්තුමා |
| (III) | ආනන්ද විද්‍යාලය | C. | හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි |
| (IV) | හින්දු විද්‍යාලය | D. | සිද්ධි ලෙබ්බේ මහතා |
| (V) | සහිරා විද්‍යාලය | E. | වලානේ ශ්‍රී සිද්ධාර්ථ හිමි |

(1) CEBAD (2) BCEAD (3) ECBAD (4) EBCDA (5) ECABD (……..)

○ අංක 16 සිට 20 තෙක් සෑම ප්‍රශ්නයකටම ගැළපෙන පිළිතුර තෝරා ඊට අදාල අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

16. රෝහණ රාජ්‍යයේ පාලකයන්ගේ නිවැරදි අනුපිළිවෙල අඩංගු වන්නේ පහත සඳහන් කවර වරණයේද?
(1) මහානාග, යටාලතිස්ස, ගෝඨාභය, කාවන්තිස්ස, දුටුගැමුණු
(2) මහානාග, ගෝඨාභය, යටාලතිස්ස, කාවන්තිස්ස, දුටුගැමුණු
(3) ගෝඨාභය, මහානාග, කාවන්තිස්ස, යටාලතිස්ස, දුටුගැමුණු
(4) ගෝඨාභය, යටාලතිස්ස, මහානාග, කාවන්තිස්ස, දුටුගැමුණු
(5) යටාලතිස්ස, කාවන්තිස්ස, දුටුගැමුණු, ගෝඨාභය, මහානාග, (……..)

17. ශ්‍රී ලංකාවට එල්ලවූ දකුණු ඉන්දියානු ආක්‍රමණවල නිවැරදි අනුපිළිවෙල දැක්වෙන්නේ පහත සඳහන් කුමන ලැයිස්තුවේද?
(1) සේන හා ගුත්තික, එළාර, සත්ද්‍රවිඩ, ෂඩ් ද්‍රවිඩ, ශ්‍රී මාර ශ්‍රී වල්ලභ
(2) එළාර, ශ්‍රී මාර ශ්‍රී වල්ලභ, සේන හා ගුත්තික, ෂඩ් ද්‍රවිඩ, සත්ද්‍රවිඩ
(3) ශ්‍රී මාර ශ්‍රී වල්ලභ, සේන හා ගුත්තික, එළාර, සත්ද්‍රවිඩ, ෂඩ් ද්‍රවිඩ
(4 සේන හා ගුත්තික, එළාර, ශ්‍රී මාර ශ්‍රී වල්ලභ, සත්ද්‍රවිඩ, ෂඩ් ද්‍රවිඩ
(5) සත්ද්‍රවිඩ, ෂඩ් ද්‍රවිඩ, දුටුගැමුණු, එළාර, ශ්‍රී මාර ශ්‍රී වල්ලභ, සේන හා ගුත්තික (……..)

18. ශ්‍රී ලංකාව පාලනය කළ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරුන්ගේ නිවැරදි අනුපිළිවෙළ අඩංගු වන්නේ පහත සඳහන් කවරවරණයේද?
(1) හෙන්රි වෝඩ්, ටොරින්ටන්, ෆෙඩ්රික් නෝත්, තෝමස් මේට්ලන්ඩ්, එඩ්වඩ් බාන්ස්
(2) ටොරින්ටන්, එඩ්වඩ් බාන්ස්, හෙන්රි වෝඩ්, තෝමස් මේට්ලන්ඩ්, ෆෙඩ්රික් නෝත්
(3) ෆෙඩ්රික් නෝත්, තෝමස් මේට්ලන්ඩ්, , එඩ්වඩ් බාන්ස්, හෙන්රි වෝඩ්, ටොරින්ටන්
(4) ෆෙඩ්රික් නෝත්, තෝමස් මේට්ලන්ඩ්, , එඩ්වඩ් බාන්ස්, ටොරින්ටන්, හෙන්රි වෝඩ්
(5) එඩ්වඩ් බාන්ස්, තෝමස් මේට්ලන්ඩ්, ෆෙඩ්රික් නෝත්, හෙන්රි වෝඩ්, ටොරින්ටන් (……..)

19. නිදහස් ශ්‍රී ලංකාවේ අගමැතිවරුන්ගේ නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන්නේ පහත සඳහන් කවර ලැයිස්තුවේද?
(1) ඩඩ්ලි සේනානායක, ඩී. එස්. සේනානායක, ජෝන් කොතලාවල, එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක, ඩබ්. දහනායක
(2) ඩී. එස්. සේනානායක, ඩඩ්ලි සේනානායක, ජෝන් කොතලාවල, එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක, ඩබ්. දහනායක
(3) ඩී. එස්. සේනානායක, ඩඩ්ලි සේනානායක, එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක, ජෝන් කොතලාවල, ඩබ්. දහනායක
(4) ඩී. එස්. සේනානායක, එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක, ඩඩ්ලි සේනානායක, ජෝන් කොතලාවල, ඩබ්. දහනායක
(5) ඩී. එස්. සේනානායක, ඩඩ්ලි සේනානායක, එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක, ජෝන් කොතලාවල, ඩබ්. දහනායක (……..)

20. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලන සමය තුළ ක්‍රියාත්මක කළ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණවල නිවැරදි අනුපිළිවෙළ අඩංගු වන්නේ පහත සඳහන් කවරවරණයේද?
(1) කෝල්බෲක්, ඩොනමෝර්, මැනිං, මැක්ලම්, සෝල්බරි
(2) කෝල්බෲක්, මැක්ලම්, මැනිං, ඩොනමෝර්, සෝල්බරි
(3) මැක්ලම්, කෝල්බෲක්, මැනිං, සෝල්බරි, ඩොනමෝර්,
(4) මැනිං, මැක්ලම්, කෝල්බෲක්, ඩොනමෝර්, සෝල්බරි,
(5) කෝල්බෲක්, මැක්ලම්, ඩොනමෝර්, මැනිං, සෝල්බරි (……..)

○ අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතරින් එකක් අදාල මාතෘකාවට නොගැලපේ. එය තෝරා ඊට අදාල අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

21. දේවානම්පියතිස්ස රජතුමා

(1) බුදුදහම ලංකාවට හඳුන්වාදෙන ලදි.
(2) භික්ෂු හා භික්ෂුණී ශාසනයෙහි ආරම්භ විය.
(3) ප්‍රථම ආරාම පූජාව සිදුවිය.
(4) මිරිසවැටිය ඉදිකළේය.
(5) මිහින්තලේ අටසැට ලෙන් කරවිය. (........)

22. දඹදෙණි යුගය

(1) දඹදෙනි රාජවංශයේ ආරම්භකයා III විජයබාහුය.
(2) දඹදෙනියේ විජයසුන්දරාරාමය නම් විහාරයක් විය.
(3) දළදා වහන්සේ බෙලිගල පර්වතයේ වැඩසිටියේය.
(4) III විජයබාහුය විසින් කාලිංග මාඝ පරාජයට පත්කළේය.
(5) චන්ද්‍රභානු නම් ජාවක රජු දෙවරක් දඹදෙනියට ආක්‍රමණ මෙහෙයවිය. (........)

23. සීතාවක බැරැන්ඩිකෝවිල

(1) II රාජසිංහ රජ විසින් ඉදිකළේය.
(2) මේ සඳහා උපදෙස් ලබාදුන්නේ අරිට්ඨ කී වෙන්ඩු පෙරුමාල්ය.
(3) සීතාවක ඔය ඉවුරේ පිහිටා ඇත.
(4) දකුණු ඉන්දියානු ගෘහ නිර්මාණ ලක්ෂණ දක්නට ලැබේ.
(5) වර්තමානය වනවිට මෙහි පුරාවිද්‍යා ස්මාරයකි. (........)

24. උඩරට රාජධානිය

(1) උඩරට රාජධානියේ අගනුවර සෙංකඩගල නමින් හැඳින්විය.
(2) මෙහි ආරම්භක පාලකයා සේනාසම්මත වික්‍රමබාහුය.
(3) මෙහි අවසන් පාලකයා ශ්‍රී වික්‍රම රාජසිංහය.
(4) යමසිංහ බණ්ඩාර I විමලධර්මසූරිය නමින් රජවිය
(5) ක්‍රි. ව. 1815 දී උඩරට ඉංග්‍රීසීන්ට යටත් විය (........)

25. කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ

(1) කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ ක්‍රි.ව. 1833 ක්‍රියාත්මක විය.
(2) ලංකාව පළාත් නවයකට බෙදා වෙන් කළේය.
(3) අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය අවලංගු කළේය.
(4) ගම්සභා ක්‍රමය තවදුරටත් පවත්වාගෙන යාම.
(5) ලංකාව ඒකීය පාලන ක්‍රමයකට යටත් කළේය. (........)

○ අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති (A), (B), (C) සහ (D) යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා

(A) සහ (B) පමණක් නිවැරදි නම් ........................................1 ද,
(B) සහ (C) පමණක් නිවැරදි නම් ........................................2 ද,
(C) සහ (D) පමණක් නිවැරදි නම් ........................................3 ද,
(A) සහ (C) පමණක් නිවැරදි නම් ........................................4 ද,
ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි නම්........................5 ද වරහන තුළ ලියන්න

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| (A) සහ (B) පමණක් නිවැරදිය. | (B) සහ (C) පමණක් නිවැරදිය. | (C) සහ (D) පමණක් නිවැරදිය. | (A) සහ (C) පමණක් නිවැරදිය. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිය. |

26. මහසෙන් රජතුමාගේ පාලන සමය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේද?
(A) ගෝඨාභයගෙන් පසු රාජ්‍යත්වයට පත්වීම
(B) ජේතවනාරාමය නිර්මාණය කිරීම
(C) සාගලිය නිකාය ආරම්භ වීම
(D) බුද්ධ ඝෝෂ හිමි ගුරුතනතුරේ තබා ගැනීම
(........)

27. ගම්පොළ යුගය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේද?
(A) IV බුවනෙකබාහු රජතුමා ගම්පොළ සිය අගනගරය කර ගැනීම
(B) ගිරා හා හංස සංදේශ රචනා කිරීම
(C) ගඩලාදෙණිය හා ලංකාතිලකය ඉදිකිරීම
(D) යාපනයට ආක්‍රමණයක් මෙහෙයවීම
(........)

28. VI පරාක්‍රමබාහු රජු සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේද?
(A) කෝට්ටේ සිය පාලන මධ්‍යස්ථානය බවට පත්කරගත්තේය.
(B) ශ්‍රී ලංකාව එක්සේසත් කළේය.
(C) සපුමල් කුමාරයාව පුත් තනතුරේ තබාගත්තේය.
(D) දකුණු ඉන්දියාව ආක්‍රමණය කළේය.
(........)

29. ක්‍රි. ව. 1818 පළමු නිදහස් සටන සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේද?
(A) මෙය මාතලේ ප්‍රදේශයෙන් ආරම්භ විය.
(B) ගොංගාලේගොඩබණ්ඩා මෙහි නායකයෙක් විය.
(C) ඉංග්‍රීසින් දරුණු ලෙස කැරැල්ල මැඩපැවැත්වූයේය.
(D) හජ්ජි මරික්කාර් මඩිගේ මුහන්දිරම් තනතුරට පත්කිරීම මෙයට ආසන්නතම හේතුව විය. (........)

30. ලංකා ජාතික සංගමය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේද?
(A) ලංකා ජාතික සංගමය 1919 ආරම්භ විය.
(B) ප්‍රථම සභාපති පොන්නම්බලම් රාමනාදන් මහතාය.
(C) එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මෙම සංගමයේ ලේකම්වරයෙකු විය.
(D) මෙය ආගමික පුනරුදය සඳහා ආරම්භ කළ සංවිධානයකි
(........)

○ අංක 31 සිට 35 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

31. මහනුවර දළඳා මාළිගය ගොඩනංවනු ලැබුවේ කවරකු විසින්ද?
(1) සේනා සම්මත වික්‍රමබාහු (2) I විමලධර්මසූරිය (3) II විමලධර්මසූරිය
(4) සෙනරත් (5) කීර්ති ශ්‍රී රාජසිංහ
(........)

32. I පරාක්‍රමබාහු රජු විසින් දෙවනගල සෙල්ලිපිය මගින් ගම්වරයක් පූජාකොට ඇති සෙන්පතියා කවුරුන්ද?
(1) බුද්ධරාජ (2) ලංකාගිරි (3) කිත්නුවරගල්
(4) රවිදේව (5) දමිළාධිකාරි ආදිත්‍ය
(........)

33. මේඝවන්නාභය ඇමති විසින් කැරැල්ලක් ඇතිකලේ කුමන රජුගේ කාලයේද?
(1) දුටුගැමුණු (2) සද්ධාතිස්ස (3) වළගම්බා
(4) මහසෙන් (5) ධාතුසේන
(........)

34. I පරාක්‍රමබාහු රජුගේ උත්පත්ති ස්ථානය මෙයින් කවරක්ද?
(1) පුංඛගාම (2) පරාක්‍රමපුර (3) මහානාගහුල
(4) වාතගිරි (5) පඬුවිඩගිරි
(........)

35. මහාබෝධි සංගමයේ නිර්මාතෘවරයා කවුරුන්ද?

(1) එච්. එස්. ඕල්කට්තුමා (2) අනගාරික ධර්මපාල තුමා (3) මිගෙට්ටුවත්තේ ගුණානන්දහිමි

(4) වලිසිංහ හරිස්චන්ද්‍ර තුමා (5) පියදස සිරිසේන මහතා (........)

○ අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවලට අදාලව ප්‍රකාශ 2 බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැලපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1,2,3,4 සහ 5 යන කවර ප්‍රකාශ යුගලදැයි තෝරා ඊට අදාල අංකය වරහන් තුළ ලියන්න.

| පළමුවැනි ප්‍රකාශය | | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදිය. | වැරදිය. |
| 2 | නිවැරදිය. | නිවැරදිය. |
| 3 | වැරදිය. | වැරදිය. |
| 4 | වැරදිය. | නිවැරදිය. |
| 5 | නිවැරදිය. | නිවැරදි වන අතර පළමුවැන්නා මැනවින් පහදා දෙයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 36 | පාලි මහා වංශයට පෙර සිංහලෙන් ලියන ලද වංශ කතාවක් දක්නට ලැබුණි. | සිංහලෙන් ලියන ලද වංශ කථාව සිහලවත්ථුප්පකරණයයි. (........) |
| 37 | මහාතිත්ථ වරාය අනුරාධපුර රාජධානියේ ප්‍රධාන වෙළඳ වරාය විය. | මහාතිත්ථ වරාය අනුරාධපුර යුගය වනවිට පෙර අපර දෙදිග වෙළඳාමේ ප්‍රධාන මධ්‍යස්ථානය විය. (........) |
| 38 | ලන්දේසීන්ගේ ආගම වූයේ රෙපරමාදු ආගමයි. | ලන්දේසීන් විසින් ප්‍රවාහන කටයුතු සඳහා ඇළ මාර්ග භාවිතා කළේය. (........) |
| 39 | ප්‍රථම කෝපිවත්ත ජෙම්ස් ටේලර් විසින් ආරම්භ කළේය. | ප්‍රථම රබර් පැළය පේරාදෙනිය උද්භිද උද්‍යානයේ රෝපණය කළේය. (........) |
| 40 | 1956 දී එක්සත් ජාතික පක්ෂය පිහිටුවන ලදි. | ලංකාවේ ප්‍රථම දේශපාලන පක්ෂය ලංකා කම්කරු පක්ෂයයි. (........) |